3) රූපයෙහි පෙන්වා ඇති පරිපථයෙහි නොසැලුම් අවස්ථාවේදී ධාරිත්‍රකයෙහි තහඩු මත ආරෝපණය



1) ශුන්‍ය වන්නේය
2) 7.5×10^{-6} C වන්නේය
3) 9.0×10^{-6} C වන්නේය
4) 10.0×10^{-6} C වන්නේය
5) 9C වන්නේය (1982)

4) පෙන්වා ඇති පරිපථයෙහි A බැටරිය හරහා විභව අන්තරය ශුන්‍ය වීමට R වල අගය කුමක් විය යුතුද?



1) $r_1 - r_2$ 2) $r_2 - r_1$ 3) $\frac{2}{3}(r_1 - r_2)$
4) $\frac{2}{3}(r_2 - r_1)$ 5) $r_1 + r_2$ (1982)

5) රූප සටහනේ පෙන්වා ඇති X, Y සහ Z නම් වූ විද්‍යුත් සංරචක විද්‍යුත් ගාමක බලය E සහ අභ්‍යන්තර ප්‍රතිරෝධය r වූ කෝෂයකට සම්බන්ධ කර ඇත. (a) සහ (c) පරිපථයන්හි ඇති ඇමීටර ශුන්‍ය නොවන පාඨාංක දක්වන අතර (b) හි ඇමීටර පාඨාංකය ශුන්‍ය වේ. දිශාමාරු යතුරු මාර්ගයෙන් මෙම පරිපථ තුනේම ධාරාවන්ගේ දිශාව මාරු කළ විට, (a) පරිපථයේ ඇති ඇමීටරයේ හැර අනෙක් ඇමීටරවල පාඨාංක නොවෙනස්ව පවතී. X, Y සහ Z හඳුනා

Scanned by CamScanner



	X	Y	Z
1)	ප්‍රතිරෝධකය	කෝෂය	කෝෂය
2)	කෝෂය	කෝෂය	ප්‍රතිරෝධකය
3)	ධාරිත්‍රකය	ධාරිත්‍රකය	ප්‍රතිරෝධකය
4)	කෝෂය	ධාරිත්‍රකය	ප්‍රතිරෝධකය
5)	ප්‍රතිරෝධකය	ප්‍රතිරෝධකය	ධාරිත්‍රකය

(1983)

6) පෙන්වා ඇති පරිපථයෙහි R_1 හා R_2 යනු $R_2 > R_1$ වන අන්දමේ ප්‍රතිරෝධ ද, I_1 , I_2 හා I_3 යනු ඒ ඒ ශාඛාවල ධාරාවන් ද වේ. පහත සඳහන් අසමානතාවලින් නිවැරදි කුමක්ද?

1) $I_3 < 2I_2$ 2) $I_3 > 2I_2$ 3) $I_3 > \frac{2I_1R_2}{R_1}$

4) $I_3 > \frac{R_1}{R_2}(I_1 + I_2)$ 5) $I_3 > \left(\frac{R_2}{R_1}\right)(I_1 + I_2)$ (1983)



7) පෙන්වා ඇති පරිපථයේ කෝෂවල අභ්‍යන්තර ප්‍රතිරෝධය නොගිණිය හැකි අතර මිලිඇමීටරය ශුන්‍ය පාඨාංකයේ දක්වයි. R හි අගය ඕමවලින්,

1) 20 2) 50 3) 100
4) 200 5) 400 (1983)



8) බැටරියක් ආරෝපණය කිරීම සඳහා 100V සරලධාර ප්‍රභවයක් භාවිත කරනු ලැබේ. දී ඇති මොහොතකදී බැටරියේ විද්‍යුත් ගාමක බලය 40V ද එහි අභ්‍යන්තර ප්‍රතිරෝධය 2Ω ද වේ. ප්‍රභවයෙන් ලබා ගන්නා ආරෝපණය කිරීමේ ධාරාව 2A වීම සඳහා බැටරිය සමග ශ්‍රේණිගතව සම්බන්ධ කළ යුතු ප්‍රතිරෝධයේ අගය,

1) 18Ω 2) 28Ω 3) 30Ω 4) 48Ω 5) 68Ω (1984)

9) රූපයේ පෙන්වා ඇති අන්දමට ප්‍රතිරෝධ 5 ක් සම්බන්ධ කර ඇත. A ඇමීටරය තුළින් ගලන ධාරාව 2A වේ. එවිට, 1Ω ප්‍රතිරෝධය තුළින් ගලන ධාරාව

1) 0 2) 0.5A 3) 1.0A
4) 1.2A 5) 2.0A (1982)



ප්‍රශ්න අංක 10 ට හා 11 ට පිළිතුරු දීම සඳහා මෙහි ඇති පරිපථය සලකා බලන්න. කෝෂයන්හි අභ්‍යන්තර ප්‍රතිරෝධය නොමැතිය.



10) S_1 වසා S_2 විවෘත ව ඇති කල්හි

A) A ට සාපේක්ෂව C හි විභවය 2V වේ.
B) A ට සාපේක්ෂව Q හි විභවය 10Vවේ.
C) S_1 හරහා ධාරාවක් නොගලයි.

ඉහත ප්‍රකාශවලින්

1) A පමණක් සත්‍ය වේ. 2) B පමණක් සත්‍ය වේ.
3) C පමණක් සත්‍ය වේ. 4) A සහ B පමණක් සත්‍ය වේ.
5) B සහ C පමණක් සත්‍ය වේ.

(1984)

Scanned by CamScanner

11) S_1 සහ S_2 යන දෙකම වසා ඇති කල්හි පොළොවට සාපේක්ෂව A හි විභවය
1) 12V 2) 10V 3) 0 4) –8 V 5) –15V (1984)

12) පෙන්වා ඇති පරිපථයෙහි සෑම කෝෂයකම අභ්‍යන්තර ප්‍රතිරෝධය 1Ω වේ. 9Ω ප්‍රතිරෝධකය හරහා ධාරාව වන්නේ,



1) 0.40A 2) 0.50A 3) 0.55A
4) 0.60A 5) 0.90A (1985)

13) රූපයෙහි 1.5V වියළි කෝෂ සැකැස්මක් පෙන්වා ඇත. පෘථිවියට සාපේක්ෂව A සහ B ලක්ෂ්‍යය දෙකෙහි විභව නිවැරදිව නිරූපණය කර ඇත්තේ මෙහි සඳහන් කුමන පේළියේද?



	A(V)	B(V)
1)	0	0
2)	0	3
3)	1.5	–1.5
4)	1.5	3
5)	1.5	4.5

(1986)

14) රූප සටහනේ පෙන්වා ඇති පරිදි සමාන සංවායක කෝෂ දෙකක් (a) ශ්‍රේණිගත ලෙස සහ (b) සමාන්තර ගත ලෙස, R ප්‍රතිරෝධයකට සම්බන්ධ කර ඇත. මෙම අවස්ථා දෙකෙහිදී ම R හරහා ධාරාව එක සමාන නම් සංවායක කෝෂයක අභ්‍යන්තර ප්‍රතිරෝධය වන්නේ,





1) $\frac{R}{4}$ 2) $\frac{R}{2}$ 3) R 4) 2R 5) 4R (1986)

15) සමාන විද්‍යුත් ගාමක බලය 2V සහ සමාන අභ්‍යන්තර ප්‍රතිරෝධ ඇති කෝෂ දෙකක් රූපයේ දක්වෙන පරිදි එකිනෙකට සම්බන්ධ කර ඇත. AB හරහා විභව අන්තරය,



1) ශුන්‍ය වේ. 2) 1V වේ.
4) 4V වේ. 3) 2V වේ.
5) කෝෂවල අභ්‍යන්තර ප්‍රතිරෝධ නොදැන ගණනය කළ නොහැකි වේ. (1988)

16) අභ්‍යන්තර ප්‍රතිරෝධයක් සහිත බැටරියක අග්‍ර හරහා විදුලි බුබුළක් සම්බන්ධ කරන ලදී. සෑම අතින්ම එක හා සමාන වූ තවත් විදුලි බුබුළක් පළමු බුබුළ හා ශ්‍රේණිගතව සම්බන්ධ කළේ නම් පහත සඳහන් ප්‍රකාශ අතුරින් නිවැරදි වන්නේ කුමක්ද?
1) බැටරියේ අග්‍ර හරහා විභව අන්තරය පෙරට වඩා අඩුවේ.
2) බැටරියේ අග්‍ර හරහා විභව අන්තරය නොවෙනස්ව පවතී.
3) බැටරියේ අග්‍ර හරහා විභව අන්තරය පෙරට වඩා වැඩිවේ.
4) බැටරියෙන් පෙරට වඩා වැඩි ධාරාවක් සපයයි.
5) බැටරියෙන් සපයන ධාරාව නොවෙනස්ව පවතී. (1989)

17) පසෙකින් පෙන්වා ඇති පරිපථයේ P විචල්‍ය ප්‍රතිරෝධයක් වන අතර Q නියත ප්‍රතිරෝධයකි. V_1 සහ V_2 අධි ප්‍රතිරෝධ වෝල්ට්මීටර වේ. V_1 සහ V_2 g ආරම්භක පාඨාංක දෙකක් ඇත. V_1 හි පාඨාංකය දෙගුණ වනතෙක් P හි අගය වෙනස් කරන ලදී. එවිට V_2 හි පාඨාංකයේ කුඩා අඩුවීමක් නිරීක්ෂණය කරන ලදී.



මෙම පරිපථය සඳහා පහත දක්වා ඇති වගන්ති අතුරෙන් අසත්‍ය වන්නේ කුමක්ද?

Scanned by CamScanner

1) Q හරහා ගලන ධාරාව දෙගුණ වේ.
2) P හි ඇතිකල වෙනස නිසා එහි ප්‍රතිරෝධය වැඩි වී ඇත.
3) බැටරියට අභ්‍යන්තර ප්‍රතිරෝධයක් ඇත.
4) බැටරියේ අග්‍ර හරහා විභව අන්තරය V_2 මගින් කියැවේ.
5) V_1 හා V_2 හි පාඨාංක සමාන වනුයේ P හි අගය ශුන්‍ය වූවොත් පමණි. (1989)

18) රූපයේ දැක්වෙන ජාලයේ a සිට b දක්වා 0.2A ක ධාරාවක් පවත්වා ගනු ලබයි. කෝෂයේ විද්‍යුත් ගාමක බලය 2V වන අතර එහි අභ්‍යන්තර ප්‍රතිරෝධය ශුන්‍ය වේ. ab හරහා විභව අන්තරය,



1) ශුන්‍ය ය. 2) 1V 3) 2V 4) 3V
5) 4V (1990)

19) අභ්‍යන්තර ප්‍රතිරෝධය නොසලකා හැරිය හැකි සර්වසම බැටරි දෙකක් R බාහිර ප්‍රතිරෝධයක් හා සම්බන්ධ කර ඇති අයුරු (A) සහ (B) රූපවල දක්වා ඇත. (A) සහ (B) 'රූපවලින් දැක්වෙන පරිපථවල R ප්‍රතිරෝධය හරහා යන ධාරාවන් අතර සම්බන්ධය වනුයේ,



1) $i_1 = 2i_2$ 2) $i_1 = i_2$ 3) $i_2 = 2i_1$ 4) $i_1 = \sqrt{2}\ i_3$ 5) $i_2 = \sqrt{2}\ i_1$
(1991)

20) පරිපථයක කොටසක් වන PQ තුළින් 1.0A ධාරාවක් පෙන්වා ඇති දිශාවට යැවූ විට පරිපථය මගින් 5W ක්ෂමතාවක් ලබා ගනී. කෝෂයේ අභ්‍යන්තර ප්‍රතිරෝධය නොගිණිය හැකි නම් එහි විද්‍යුත් ගාමක බලය වන්නේ,



1) 5V ය. 2) 4V ය. 3) 3Vය. 4) 2V ය. 5) 1V ය. (1991)

21) පෙන්වා ඇති පරිපථයේ බැටරියට 6V ක විද්‍යුත් ගාමක බලයක් සහ 0.2Ω අභ්‍යන්තර ප්‍රතිරෝධයක් ඇත. කෝෂය තුළින් ගලන ධාරාව 2A නම් V වෝල්ට්මීටරයේ පාඨාංකය



1) 6V 2) 5.8V 3) 5.6V
4) 5.4V 5) 2.8V (1993)

22) අභ්‍යන්තර ප්‍රතිරෝධය 10Ω වූ 9V කෝෂයක් පිළිබඳ කර ඇති පහත සඳහන් ප්‍රකාශ සලකා බලන්න.
A) 10.9A ට වඩා විශාල ධාරා ලබා ගැනීම සඳහා මෙම කෝෂය භාවිත කළ නොහැකිය.
B) 10Ω ට වඩා ප්‍රතිරෝධයක් ඇති ප්‍රතිරෝධයක් අග්‍ර හරහා සම්බන්ධ කළ විට කෝෂය විසින් ප්‍රතිරෝධකය හරහා ඇති කරනු ලබන්නේ 4.5V ට අඩු විභව අන්තරයකි.
C) අග්‍ර හරහා සම්බන්ධ කර ඇති බාහිර පරිපථයකට කෝෂය මගින් 9V සපයනු ලබන්නේ එම පරිපථය කිසිම ධාරාවක් ඇද නොගන්නේ නම් පමණි.
මෙම ප්‍රකාශ අතුරින්
1) A පමණක් සත්‍ය වේ. 2) C පමණක් සත්‍ය වේ.
3) A සහ C පමණක් සත්‍ය වේ. 4) B සහ C පමණක් සත්‍ය වේ.
5) A, B සහ C යන සියල්ලම සත්‍ය වේ. (1995)

Scanned by CamScanner

23) පෙන්වා ඇති පරිපථ රූප සටහනේ E යනු විද්‍යුත් ගාමක බලය 12V සහ අභ්‍යන්තර ප්‍රතිරෝධය 3Ω වන කෝෂයකි. A යනු නොගිණිය හැකි ප්‍රතිරෝධයක් සහිත ඇමීටරයකි. S ස්විච්චිය වැසූ විට A හි පාඨාංකය



1) 0.5 A 2) 1 A 3) 2 A
4) 4 A 5) 8 A (1997)

24) සමාන විද්‍යුත් ගාමක බලය අගයන් සහිතව ද, එහෙත් එකක අභ්‍යන්තර ප්‍රතිරෝධය ශුන්‍ය සහ අනෙකෙහි අභ්‍යන්තර ප්‍රතිරෝධය පරිමිත අගයක් සහිතව ද වන කෝෂ දෙකක් සඳහා කර ඇති පහත සඳහන් ප්‍රකාශ සලකා බලන්න.

A) අග්‍රයන් ලුහුවත් කළ විට කෝෂ දෙකම අපරිමිත ධාරා ඇති කරයි.
B) සර්වසම ප්‍රතිරෝධ හරහා සම්බන්ධ කළ විට මෙම කෝෂ දෙකෙහි ම අග්‍ර අතර විභව අන්තර එක සමාන වේ.
C) විශාල ධාරාවක් ලබා ගත් විට කෝෂ දෙකින් එකක් රත්වීමට භාජනය වේ.

ඉහත සඳහන් ප්‍රකාශ අතරින්,
1) A පමණක් සත්‍ය වේ. 2) C පමණක් සත්‍ය වේ.
3) B සහ C පමණක් සත්‍ය වේ. 4) A සහ C පමණක් සත්‍ය වේ.
5) A, B සහ C සියල්ල ම සත්‍ය වේ. (1997)

25) රූපයේ දැක්වෙනු පරිපථය සඳහා ඇමීටරයේ පාඨාංකය ශුන්‍ය කළ විට වෝල්ට්මීටරයේ පාඨාංකය 2V වේ. වෝල්ට්මීටරයේ පාඨාංකය ශුන්‍ය කළ විට (කුඩා කාලයකට) ඇමීටරයේ පාඨාංකය 1A වේ. ඇමීටරයේ ප්‍රතිරෝධය නොගිණිය හැකි නම් කෝෂයේ අභ්‍යන්තර ප්‍රතිරෝධය වනුයේ,



1) 0Ω 2) 0.5Ω 3) 1Ω 4) 2Ω 5) 3Ω (1997)

26) පෙන්වා ඇති පරිපථයේ කෝෂවල අභ්‍යන්තර ප්‍රතිරෝධය නොගිණිය හැක. Y ට සාපේක්ෂව X හි විභවය



1) 0 2) –1V 3) +1V
4) – 3V 5) +3V (1998)

27)



විද්‍යුත් ගාමක බලය E වන අභ්‍යන්තර ප්‍රතිරෝධය නොගිණිය හැකි සර්වසම කෝෂ තුනක් රූපයේ පෙන්වා ඇති පරිදි සම්බන්ධ කර ඇත. AB හරහා විභව බැස්ම වන්නේ,

1) 0 2) $\frac{E}{2}$ 3) E. 4) 2E 5) 3E (2000)

28) පහත සඳහන් කුමක් මගින් 1.5V වියලි කෝෂයකට අභ්‍යන්තර ප්‍රතිරෝධයක් තිබෙන බව නොපෙන්වයිද?

1) එහි අග්‍ර අතර වෝල්ටීයතාවය එය සම්බන්ධ කොට ඇති ප්‍රතිරෝධයේ අගය සමග විචලනය වේ.
2) එවැනි කෝෂ කිහිපයක් සමාන්තරගතව සම්බන්ධ කළ විට අග්‍ර අතර වෝල්ටීයතාවය සුළු ප්‍රමාණයකින් වැඩි වේ.
3) එහි අග්‍ර අතර වෝල්ටීයතාවය, එය මැනීමට භාවිත කරන වෝල්ට්මීටරයේ අභ්‍යන්තර ප්‍රතිරෝධය සමග රඳා පවතී.
4) එහි අග්‍ර ලුහුවත් කළ විට කෝෂය රත් වේ.
5) පරිපූර්ණ වෝල්ට්මීටරයක් මගින් එහි අග්‍ර අතර වෝල්ටීයතාවය මනිනු ලැබූ විට එය 1.5V අගයක් පෙන්වයි. (2002)

Scanned by CamScanner

29) විද්‍යුත් ගාමක බලය E හා අභ්‍යන්තර ප්‍රතිරෝධය r වන කෝෂයක් රූපයේ පෙන්වා ඇති පරිදි R විචල්‍ය ප්‍රතිරෝධයකට ශ්‍රේණිගතව සම්බන්ධ කොට ඇත. පහත සඳහන් කුමක් මගින් R ප්‍රතිරෝධ සමග පරිපථය තුළ I ධාරාවේ විචලනය වඩාත් ම හොඳින් නිරූපණය කරයිද?





(2002)

30)



(A) සහ (B) පරිපථ අභ්‍යන්තර ප්‍රතිරෝධය නොගිණිය හැකි සර්වසම කෝෂ භාවිත කරයි. කාලය t = 0 දී පරිපථ දෙකෙහි ම ස්විච්චි වසා දිගු කාලයක් ගතවන්නට ඉඩ හරින ලදී. පහත සඳහන් කුමක් මගින් කාලය t සමග R හරහා විභව අන්තරය V හි විචලනය වඩාත් ම හොඳින් නිරූපණය කරයිද?



(2002)

31)



පෙන්වා ඇති පරිපථයේ කෝෂවල අභ්‍යන්තර ප්‍රතිරෝධ නොගිණිය හැකිය. XY හරහා වෝල්ටීයතාව වනුයේ,

1) 1.6 V
2) 3.75 V
3) 5V
4) 7.5 V
5) 15 V

(2004)

32) පෙන්වා ඇති පරිපථයේ සියලු කෝෂයන්හි අභ්‍යන්තර ප්‍රතිරෝධ නොගිණිය හැකිය. පරිපථයේ ධාරාව I වේ. පහත සඳහන් සමීකරණ අතුරෙන් පරිපථය සඳහා කුමක් සත්‍ය ද?



1) $E_1 + E_2 + E_3 = I(r_1 + r_2 + r_3)$
2) $E_1 + E_2 + E_3 = I(-r_1 + r_2 + r_3)$
3) $E_1 - E_2 - E_3 = I(r_1 - r_2 - r_3)$
4) $-E_1 + E_2 + E_3 = I(r_1 + r_2 + r_3)$
5) $-E_1 + E_2 - E_3 = I(-r_1 + r_2 - r_3)$

(2004)

33) යම් දෝෂයක් නිසා 60W, 230 V විදුලි බල්බයක සූත්‍රිකාව සම්මත දිගට වඩා කෙටි වී ඇත. මෙම බල්බය දල්වෙමින් පවතින විට,

A) එය වඩා දීප්තිමත්ව දල්වෙන අතර සම්මත 60W බල්බයකට වඩා වැඩි ක්ෂමතාවක් පරිභෝජනය කරයි.
B) විමෝචනය වන ආලෝකයේ උපරිම තීව්‍රතාවයට අනුරූප තරංග ආයාමය සම්මත 60W බල්බයකට එම අගයට වඩා අඩු වේ.
C) බල්බයෙහි වීදුරු ආවරණයේ පෘෂ්ඨයෙහි උෂ්ණත්වය සම්මත 60W බල්බයක පෘෂ්ඨයේ උෂ්ණත්වයට වඩා ඉහළ අගයක පවතී.

Scanned by CamScanner

ඉහත ප්‍රකාශවලින්

1) A පමණක් සත්‍ය වේ.
2) A සහ B පමණක් සත්‍ය වේ.
3) B සහ C පමණක් සත්‍ය වේ.
4) A සහ C පමණක් සත්‍ය වේ.
5) A, B සහ C සියල්ල ම සත්‍ය වේ.

(2006)

34) රූපයේ පෙන්වා ඇති E_1 සහ E_2 කෝෂ සඳහා ශූන්‍ය අභ්‍යන්තර ප්‍රතිරෝධ ඇත. A සහ B අග්‍ර අතර වෝල්ටීයතාව V වන්නේ



1) $E_1 - E_2$
2) $E_1 + E_2$
3) $\frac{E_1 + E_2}{4}$
4) $\frac{E_1 - E_2}{2}$
5) $\frac{E_1 + E_2}{2}$

(2007)

35) පෙන්වා ඇති පරිපථයෙහි බැටරි සඳහා නොගිණිය හැකි අභ්‍යන්තර ප්‍රතිරෝධ ඇත. පරිපථයේ A, B, C සහ D ලක්ෂ්‍යවල විභව පිළිවෙලින් V_A, V_B, V_C සහ V_D මගින් නිරූපණය කරනු ලබන්නේ නම්



1) $V_B - V_D = 18$ V
2) $V_A \neq V_D$
3) $V_B - V_C = \frac{6}{124}$ V
4) $V_A - V_C = -6$ V
5) R = 0 නම් පමණක් $V_A - V_D = 0$

(2008)

36) නොගිණිය හැකි අභ්‍යන්තර ප්‍රතිරෝධ සහිත සර්වසම බැටරි හතරක් (A), (B) සහ (C) රූප මගින් පෙන්වා ඇති පරිදි සම්බන්ධ කර ඇත.



බැටරි හරහා ධාරා ශූන්‍ය වන්නේ

1) (A) සැකැස්මේ පමණි.
2) (C) සැකැස්මේ පමණි.
3) (A) සහ (C) සැකැස්මේ පමණි.
4) (B) සහ (C) සැකැස්මේ පමණි.
5) (A) සහ (B) සැකැස්මේ පමණි.

(2009)

37) රූපයෙහි දක්වා ඇති පරිපථයේ 150 Ω ප්‍රතිරෝධකය හරහා ධාරාව වන්නේ



1) 0.01 A
2) 0.05 A
3) 0.10 A
4) 0.33 A
5) 0.50 A

(2009)

38) පෙන්වා ඇති පරිපථයෙහි A ඇමීටරය හරහා ධාරාව වන්නේ,



(1) 0
(2) $\frac{V}{3R}$
(3) $\frac{3V}{2R}$
(4) $\frac{V}{R}$
(5) $\frac{3V}{R}$

(2010)

Scanned by CamScanner

39) පෙන්වා ඇති පරිපථයේ බැටරිවලට නොගිණිය හැකි අභ්‍යන්තර ප්‍රතිරෝධ ඇත. පරිපථයේ ධාරාවන්ගේ විශාලත්වය පිළිබඳ ව පහත සඳහන් කුමක් සත්‍ය **නොවේද?**



1) $I_1 = I_3$ 2) $I_3 = I_5$ 3) $I_2 = 0$
4) $I_4 = 0$ 5) $I_6 = I_1$ (2011 N)

40) 10 Ω ප්‍රතිරෝධකය හරහා ධාරාව වන්නේ,

1) 0A
2) 1.5 A
3) 3.0 A
4) 5.0 A
5) 6.0 A



(2012 N-36)

41) වි. ගා. බ. 9V වූ කෝෂයක අග්‍ර කුඩා කාලයකට ලුහුවත් කළ විට ලුහුවත් කිරීම හරහා 0.45A ධාරාවක් ගලන බව සොයා ගන්නා ලදී. කෝෂයේ අභ්‍යන්තර ප්‍රතිරෝධය වන්නේ,

1) 0.2Ω 2) 0.6Ω 3) 2Ω 4) 20Ω 5) 40Ω (2012 O-17)

42) XY හරහා ධාරාව ශූන්‍ය කරවීම සඳහා V_C බැටරියට තිබිය යුතු වෝල්ටීයතාව වන්නේ,

1) 6V 2) 8V
3) 10V 4) 12V
5) 15V (2012 O-35)



43)



a ලක්ෂ්‍යයේ සිට b ලක්ෂ්‍යය කරා 2.0A ධාරාවක් ගලා යන්නේ නම්, a සහ b ලක්ෂ්‍ය අතර විභව අන්තරය වන්නේ"

1) 6V 2) 8V 3) 14V 4) 20V 5) 22V (2012 O-42)

44) පෙන්වා ඇති පරිපථයේ S සංවෘත සහ විවෘත කළ විට V_1 වෝල්ටීයතාව වනු ඇත්තේ

	S සංවෘත කළ විට	S විවෘත කළ විට
1)	$V_1/3$	$V_1/4$
2)	$V_1/2$	$V_1/4$
3)	$V_1/3$	$3V_1/5$
4)	$V_1/2$	$3V_1/5$
5)	0	$V_1/4$



(2012 O-41)

45) රූපයේ දැක්වෙන පරිපථයේ 5Ω ප්‍රතිරෝධකය හරහා ධාරාවක් නො ගලයි නම්, $\left(\frac{R_1}{R_2}\right)$ අනුපාතය කුමක් ද?



1) $\frac{2}{5}$ 2) $\frac{3}{5}$ 3) $\frac{2}{3}$ 4) 1
5) $\frac{3}{2}$

(2013N-45)

Scanned by CamScanner

46) A සහ B අතර කිසියම් V විභව අන්තරයක් යෙදූ විට R_1 හරහා 3A ධාරාවක් ද, R_2 හරහා 2A ධාරාවක් ද ගලා යයි. A සහ B අතර සමක ප්‍රතිරෝධය කුමක් ද?



1) $\frac{4}{3}\Omega$ 2) $\frac{7}{5}\Omega$ 3) $\frac{3}{2}\Omega$ 4) 6Ω

5) 7Ω (2013N-47)

47) රූපයේ දක්වෙන ආකාරයට සම්බන්ධ කර ඇති. එක් එක් හි වි. ගා. බ. E සහ අභ්‍යන්තර ප්‍රතිරෝධය r වන කෝෂ දෙකක් සමක වන්නේ,



1) වි. ගා. බ. E සහ අභ්‍යන්තර ප්‍රතිරෝධය r වන තනි කෝෂයකට ය.
2) වි. ගා. බ. 2E සහ අභ්‍යන්තර ප්‍රතිරෝධය 2r වන තනි කෝෂයකට ය.
3) වි. ගා. බ. 2E සහ අභ්‍යන්තර ප්‍රතිරෝධය r වන තනි කෝෂයකට ය.
4) වි. ගා. බ. E සහ අභ්‍යන්තර ප්‍රතිරෝධය $\frac{r}{2}$ වන තනි කෝෂයකට ය.
5) වි. ගා. බ. E සහ අභ්‍යන්තර ප්‍රතිරෝධය 2r වන තනි කෝෂයකට ය. (2014-6)

48) රූපයේ පෙන්වා ඇති පරිපථයෙහි R_2 ප්‍රතිරෝධය ශුන්‍යයේ සිට අනන්තය දක්වා වෙනස් කරන විට B ට සාපේක්ෂ ව A හි විභවය වෙනස් වන්නේ,



1) ශුන්‍යයේ සිට ශුන්‍යයට ය.
2) $\frac{R_1}{R_4+R_1}V_0$ සිට ශුන්‍යයට ය.
3) $\frac{R_1}{R_4+R_3}V_0$ සිට $\frac{R_1}{R_4+R_1}V_0 - V_0$ ට ය.
4) $\frac{R_3}{R_4+R_3}V_0$ සිට $\frac{R_3}{R_4+R_3}V_0 - V_0$ ට ය.
5) $\frac{R_3}{R_4+R_3}V_0$ සිට $\frac{R_4}{R_4+R_3}V_0 - V_0$ ට ය. (2014-48)

49) දී ඇති පරිපථයෙහි A ඇමීටරයේ කියවීම, S_1 හා S_2 ස්විච්චි දෙකම වසා හෝ දෙකම විවෘත ව ඇති විට එකම අගයක් දක්වයි. A පරිපූර්ණ ඇමීටරයක් නම්, R ප්‍රතිරෝධයෙහි අගය වනුයේ,



1) 1Ω 2) 2Ω 3) 3Ω 4) 4Ω 5) 6Ω (2015-43)

04 විට්ස්ටන් සේතු හා මීටර් සේතු

1) දී ඇති පරිපථයේ X සහ Y අතර සමක ප්‍රතිරෝධය වනුයේ,



1) 1.8Ω 2) 3.6Ω 3) 10Ω
4) 16Ω 5) 3Ω (1984)

2)



දී ඇති පරිපථයේ ගැල්වනෝමීටරයෙහි ශුන්‍ය උත්ක්‍රමයක් ලබා දෙන R හි අගය වනුයේ,

1) 5Ω 2) 9Ω 3) 15Ω
4) 18Ω 5) 36Ω (1986)

Scanned by CamScanner

3) රූපයේ දැක්වෙන පරිපථය ප්‍රතිරෝධ 10 කින් සමන්විත ය. A සහ C අතර සමක ප්‍රතිරෝධය



1) r
2) 2r
3) 4r
4) 8r
5) 12r

(1987)

4) PQRS යනු සමතුලිත විට්ස්ටන් සේතු පරිපථයකි. රූපයේ පෙනෙන ආකාරයට දූන් PXRY නම් තවත් සමතුලිත සේතු පරිපථයක් එම කෝෂයටම සම්බන්ධ කරනු ලැබේ. පහත සඳහන් ප්‍රකාශ සලකා බලන්න.



A) PXRY පරිපථය ඇමුණූ විට PQRS හි සමතුලිත තත්ත්වය වෙනස් විය හැක.

B) X සහ Q අතර ගැල්වනෝමීටරයක් සම්බන්ධ කළහොත් එය සෑම විටම ශූන්‍ය උත්ක්‍රමයක් පෙන්වයි.

C) QS හරහා කෝෂය සම්බන්ධ කළහොත් PXRY ජාලයෙහි ප්‍රතිරෝධ හරහා ධාරාවක් නොගලයි.

ඉහත සඳහන් ප්‍රකාශ අතුරින්,

1) A පමණක් සත්‍ය වේ.
2) B පමණක් සත්‍ය වේ.
3) C පමණක් සත්‍ය වේ.
4) A සහ B පමණක් සත්‍ය වේ.
5) A සහ C පමණක් සත්‍ය වේ.

(1989)

5) පෙන්වා ඇති පරිපථයෙහි X සහ Y ලක්ෂ්‍ය දෙක අතර සමක ප්‍රතිරෝධය වනුයේ,



1) 5R ය.
2) 4R ය.
3) $\frac{5R}{2}$ ය.
4) 2R ය.
5) R ය.

(1991)

6) පෙන්වා ඇති පරිපථයේ 6V කෝෂයෙහි අභ්‍යන්තර ප්‍රතිරෝධ නොගිණිය හැකි තරම් කුඩා වන අතර V වෝල්ට්මීටරයේ පාඨාංකය ශූන්‍ය වේ. නොගිණිය හැකි අභ්‍යන්තර ප්‍රතිරෝධයක් සහිත A ඇමීටරයේ පාඨාංකය,



1) 0 වෙයි.
2) 0.05A වෙයි.
3) 0.1A වෙයි.
4) 0.6A වෙයි.
5) දී ඇති දත්ත මගින් ගණනය කළ නොහැකිය.

(1992)

7) ඉහත පරිපථයේ 10Ω ප්‍රතිරෝධයෙහි තාපයක් නොඉපදවන්නේ R හි කුමන අගයක් සඳහාද?



1) 0
2) 3Ω
3) 6Ω
4) 9Ω
5) 12Ω

(1995)

Scanned by CamScanner

8) රූපයේ පෙන්වා ඇති වීට්ස්ටන් සේතුව සංතුලනය වී පවතී. පහත ප්‍රකාශ සලකා බලන්න.



A) G ගැල්වනෝමීටරය වෙනස් ප්‍රතිරෝධයක් සහිත වෙනත් ගැල්වනෝමීටරයක් මගින් ආදේශ කළ විට සංතුලන අවස්ථාව වෙනස් නොවේ.

B) වෙනස් විද්‍යුත් ගාමක බලයක් සහිත වෙනත් කෝෂයක් මගින් E කෝෂය ආදේශ කළ විට සංතුලන අවස්ථාව වෙනස් නොවේ.

C) R සහ S ප්‍රතිරෝධ එකිනෙක මාරු කළ විට සංතුලන අවස්ථාව වෙනස් නොවේ.

ඉහත ප්‍රකාශ අතරෙන්

1) A පමණක් සත්‍ය වේ.
2) B පමණක් සත්‍ය වේ.
3) C පමණක් සත්‍ය වේ.
4) A සහ B පමණක් සත්‍ය වේ.
5) A, B සහ C සියල්ලම සත්‍ය වේ.

(2002)

9) පෙන්වා ඇති පරිපථයේ 5Ω ප්‍රතිරෝධකය තුළින් ගලන ධාරාව වනුයේ



1) 0
2) 0.1 A
3) 0.2A
4) 0.4 A
5) 0.5 A

(2004)

10) 5Ω ප්‍රතිරෝධකයේ ජනනය වන තාපය අවම කරන R විචල්‍ය ප්‍රතිරෝධකයේ අගය වනුයේ



1) 6 Ω
2) 9 Ω
3) 15 Ω
4) 45 Ω
5) 90 Ω

(2005)

11) සංතුලනය කර ඇති මීටර සේතුවක් රූපයේ දැක්වේ. සමාන්තරගතව සම්බන්ධ කර ඇති සර්වසම ප්‍රතිරෝධක කම්බි යුගලයක් P මගින් දැක්වේ. එක් ප්‍රතිරෝධක කම්බියක් ඉවත් කළ විට නව සංතුලන දිග ආසන්න වශයෙන් සමාන වනුයේ



1) 22 cm
2) 44 cm
3) 55 cm
4) 67 cm
5) 92 cm

(2006)

12) රූපයේ පෙන්වා ඇති සේතු පරිපථයේ ප්‍රතිරෝධ R_1, R_2, R_3 සහ R_4 සඳහා ලබා දිය හැකි එකිනෙකට වෙනස් අගයයන් කාණ්ඩ පහත පහත වගුවේ දක්වා ඇත. පහත සඳහන් කුමන කාණ්ඩය වෝල්ට්මීටරයේ වැඩිම උත්ක්‍රමය ඇති කරයි ද?

	කාණ්ඩය	$R_1 \Omega$	$R_2 \Omega$	$R_3 \Omega$	$R_4 \Omega$
1)	1	30	5	30	5
2)	2	20	15	10	25
3)	3	25	10	10	25
4)	4	10	25	25	10
5)	5	30	5	5	30



(2006)

13) පෙන්වා ඇති පරිපථයේ *ac* යනු දිග 1m වන ඒකාකාර ප්‍රතිරෝධී කම්බියකි. ගැල්වනෝමීටරයේ පාඨාංකය ශුන්‍ය වන විට, *a* ලක්ෂ්‍යයේ සිට b ලක්ෂ්‍යයට ඇති දුර 20 cm වේ.

$\frac{R_1}{R_2}$ අනුපාතය වන්නේ



1) 5
2) 4
3) $\frac{1}{4}$
4) $\frac{1}{5}$
5) $\frac{1}{10}$

(2008)

Scanned by CamScanner

14) අගය R වන නියත ප්‍රතිරෝධක තුනක් සහ ප්‍රතිරෝධය r වූ විචල්‍ය ප්‍රතිරෝධකයක් විද්‍යුත් ගාමක බලය E සහ අභ්‍යන්තර ප්‍රතිරෝධය ශුන්‍ය වන බැටරියකට රූපයේ දක්වෙන ආකාරයට සම්බන්ධ කර ඇත. r සමග A සහ B අතර විභව අන්තරයේ (V_0) විචලනය වඩාත් හොඳින් නිරූපණය කරනු ලබන්නේ





(1) (2) (3) (4) (5) (2009)

05 සල දඟර මීටර

1) පහත දක්වෙන මිනුම් උපකරණ අතුරෙන් වෝල්ටීයතාව මැනීම සඳහා පාවිච්චි කළ නොහැක්කේ කුමක්ද?

1) සල දඟර ගැල්වනෝමීටරය 2) විභවමානය 3) විද්‍යුත්ධරය
4) ස්වර්ණ පත්‍ර විද්‍යුත් දර්ශකය 5) කැතෝඩ කිරණ දෝලනේක්ෂය (1989)

2) ගැල්වනෝමීටරයක් නොසැලෙන ධාරා ප්‍රභවයකට සන්ධිකර ඇත. මෙම ගැල්වනෝමීටරය හරහා උප පථයක් සම්බන්ධ කරන ලදී. මෙසේ කරන ලද,

1) ගැල්වනෝමීටරයට අඩු ප්‍රතිරෝධයක් ඇත.
2) ගැල්වනෝමීටරයට අඩු සංවේදිතාවක් ඇත.
3) ගැල්වනෝමීටරය හරහා පෙරට වඩා වැඩි වෝල්ටීයතාවක් ඇත.
4) ගැල්වනෝමීටරය තුල පෙරට වඩා අඩු ධාරාවක් ඇත.
5) ගැල්වනෝමීටරයේ පාඨාංකය මුල් අගයේ ම පවතී. (1989)

3) R ප්‍රතිරෝධයේ අගය සෙවීම සඳහා අභ්‍යන්තර ප්‍රතිරෝධය R_V වන වෝල්ට්මීටරයක් සහ අභ්‍යන්තර ප්‍රතිරෝධය R_A වන ඇමීටරයක් සම්බන්ධ කොට ඇති අන්දම රූපයේ පෙන්වා ඇත. වෝල්ට්මීටරයේ පාඨාංකය V හා ඇමීටරයේ දක්වෙන ධාරාවේ අගය *I* අතර අනුපාතයෙන් ලැබෙන R' ප්‍රතිරෝධය, R හා සමග සම්බන්ධ වී ඇත්තේ,



1) $\frac{1}{R'} = \frac{1}{R} - \frac{1}{R_v} - \frac{1}{R_A}$ මගිනි. 2) $\frac{1}{R'} = \frac{1}{R} - \frac{1}{R_v}$ මගිනි. 3) $\frac{1}{R'} = \frac{1}{R} + \frac{1}{R_v}$ මගිනි.

4) $R' = R + R_v + R_A$ මගිනි. 5) $R' = \frac{R}{R_v} + R_A$ මගිනි. (1992)

4) පූර්ණ පරිමාණ උත්ක්‍රමය 1 mA පාඨාංකයක් දෙන ගැල්වනෝමීටරයක ප්‍රතිරෝධය 75Ω වේ. 0.0751Ω ප්‍රතිරෝධකයක් සුදුසු ආකාරයට සම්බන්ධ කිරීමෙන් 1A දක්වා ධාරාවක් මැනීමට මෙම ගැල්වනෝමීටරය පාවිච්චි කළ හැකිය. මේ ආකාරයට සාදන ලද ඇමීටරයේ සඵල ප්‍රතිරෝධයෙහි අගය ආසන්න වශයෙන්

1) 75Ω 2) 75.075Ω 3) 0.075Ω 4) 69.925Ω 5) 0.75Ω (1995)

5) නියමිත ආකාරයට ක්‍රමාංකණය කර ඇති A, B සහ C නම් වෝල්ට්මීටර තුනක් එක්තරා කෝෂයක් හරහා වෙන් වෙන්ව සම්බන්ධ කළ විට ලැබෙන පාඨාංක V_A, V_B සහ V_C පහත දක්වා ඇත. $V_A = 8.95V$ $V_B = 8.85V$ $V_C = 8.75V$

වෝල්ට්මීටර තුනම කෝෂය හරහා එකවර සම්බන්ධ කල විට ඒවාහි පාඨාංක විය හැක්කේ,

	V_A (V)	V_B (V)	V_C (V)
1)	8.95	8.95	8.95
2)	8.85	8.85	8.85
3)	8.75	8.75	8.75
4)	8.61	8.61	8.61
5)	8.75	8.61	8.51

(1996)

Scanned by CamScanner

6) ප්‍රතිරෝධය 96Ω වූ ඇමීටරයක් තුළින් මුළු ධාරාවකින් 20% පමණක් ගලායාමට අවශ්‍ය උපපථය වනුයේ,

1) 9.6Ω 2) 19.2Ω 3) 24Ω 4) 48Ω 5) 60Ω (1998)

7) පෙන්වා ඇති පරිපථයේ A ඇමීටරයට නොගිණිය හැකි අභ්‍යන්තර ප්‍රතිරෝධයක් ඇත. පරිපථයෙන් වෝල්ට්මීටරය ඉවත් කළ විට, ඇමීටර පාඨාංකය 1.5 mA කින් වෙනස් වේ. වෝල්ට්මීටරයේ අභ්‍යන්තර ප්‍රතිරෝධය



1) 500Ω 2) 1000Ω
3) 1500Ω 4) 2000Ω 5) 3000Ω (1998)

8)



(P)



(Q)

රූපයේ දැක්වෙන (P) සහ (Q) පරිපථයන් හි XY අග්‍ර අතර විභව අන්තරය පිළිබඳ ව කර ඇති පහත සඳහන් ප්‍රකාශ සලකා බලන්න. කෝෂ දෙකෙහි ම විද්‍යුත් ගාමක බලය E වන අතර ඒවායේ අභ්‍යන්තර ප්‍රතිරෝධ නොසලකා හැරිය හැක.

A) පරිපථ දෙකෙහි ම XY හරහා විභව අන්තරය සමාන වේ.
B) පරිමිත අභ්‍යන්තර ප්‍රතිරෝධයක් සහිත වෝල්ට්මීටරයක් XY හරහා සම්බන්ධ කළ හොත් ශුන්‍ය නොවූ ස්ථායි වෝල්ටීයතා කියවීමක් ලැබිය හැක්කේ Q හි පමණි.
C) වෝල්ට්මීටරය පරිපූර්ණ නම් පරිපථ දෙකෙහි ම XY හරහා එක සමාන වෝල්ටීයතා කියවීමක් ලැබේ.

ඉහත ප්‍රකාශ අතරෙන්

1) A පමණක් සත්‍ය වේ. 2) C පමණක් සත්‍ය වේ.
3) B සහ C පමණක් සත්‍ය වේ. 4) A සහ C පමණක් සත්‍ය වේ.
1) A, B සහ C සියල්ලම සත්‍ය වේ. (2000)

9) S ස්විච්චියේ පිහිටීම් තුනට පූර්ණ පරිමාණ පාඨාංක 1V, 10V සහ 100V ලබා දෙන බහු පරිමාණ වෝල්ට්මීටරයක සැකසුමක් රූපයේ පෙන්වා ඇත. 1mA ධාරාවක් මගින් G ගැල්වනෝමීටරයේ පූර්ණ පරිමාණ උත්ක්‍රමනයක් පෙන්වනු ලබන අතර එයට නොගිණිය හැකි ප්‍රතිරෝධයක් ඇත.



R_1, R_2 සහ R_3 අගයයන් පිළිවෙලින් වනුයේ

1) 1kΩ, 1kΩ, 1kΩ 2) 1kΩ, 10kΩ, 100kΩ 3) 1kΩ, 9kΩ, 99kΩ
4) 1kΩ, 9kΩ, 90kΩ 5) 1kΩ, 100kΩ, 1000kΩ (2003)

10) පෙන්වා ඇති පරිපථයේ වෝල්ට්මීටරය V සහ ඇමීටරය A සඳහා කර ඇති පහත ප්‍රකාශ සලකා බලන්න.



A) නියමාකාර ක්‍රියාකාරිත්වය සඳහා ඇමීටරයේ සෘණ අග්‍රය වෝල්ට්මීටරයේ ධන අග්‍රයට සම්බන්ධ කළ යුතුය.
B) නියමාකාර ක්‍රියාකාරිත්වය සඳහා වෝල්ට්මීටරයේ අභ්‍යන්තර ප්‍රතිරෝධය සඳහා R ට වඩා අඩු අගයක් තිබිය යුතුය.
C) වැරදීමකින් A සහ V මාරු කොට සම්බන්ධ කළේ නම් නියමාකාර ක්‍රියාකාරිත්වය යටතේ ලැබුණු පාඨාංකයට වඩා අඩු පාඨාංකයක් දුන් ඇමීටරයෙන් කියවේ යැයි අපේක්ෂා කළ හැකිය.

Scanned by CamScanner

ඉහත ප්‍රකාශ අතුරෙන්

1) A පමණක් සත්‍ය වේ. 2) A සහ B පමණක් සත්‍ය වේ.
3) B සහ C පමණක් සත්‍ය වේ. 4) A සහ C පමණක් සත්‍ය වේ.
1) A, B සහ C සියල්ලම සත්‍ය වේ. (2004)

11) 200 Ω අභ්‍යන්තර ප්‍රතිරෝධයක් සහිත ගැල්වනෝමීටරයක් තුළින් 5 mA ධාරාවක් යැවූ විට එය පූර්ණ පරිමාණ උත්ක්‍රමයක් ඇති කරයි. මෙම ගැල්වනෝමීටරය 10A සඳහා පූර්ණ පරිමාණ උත්ක්‍රමයක් ලබා දෙන ඇමීටරයක් ලෙස භාවිත කිරීම සඳහා අවශ්‍ය බාහිර ප්‍රතිරෝධයේ ආසන්න අගය සහ එය ගැල්වනෝමීටරය සමඟ සම්බන්ධ කළයුතු ආකාරය වන්නේ

1) 0.2 Ω, ශ්‍රේණිගතව ය. 2) 0.2 Ω, සමාන්තරගතව ය. 3) 2.0 Ω, සමාන්තරගතව ය
3) 0.1 Ω, ශ්‍රේණිගතව ය. 5) 0.1 Ω, සමාන්තරගතව ය. (2008)

12) අභ්‍යන්තර ප්‍රතිරෝධ පිළිවෙලින් 15000 Ω සහ 13500 Ω වන A සහ B නම් වෝල්ට්මීටර දෙකක් වි.ගා.බලය 10 V වූ පරිපූර්ණ බැටරියක් සමඟ (a) ශ්‍රේණිගතව සහ (b) සමාන්තරගතව සම්බන්ධ කර ඇත. A සහ B මගින් කියවනු ලබන වෝල්ටීයතා නිවැරදිව දක්වන්නේ කවරක් මගින් ද?

	(a) A සහ B ශ්‍රේණිගත විට		(b) A සහ B සමාන්තරගත විට	
	A හි කියවීම (V)	B හි කියවීම (V)	A හි කියවීම (V)	B හි කියවීම (V)
1)	10	10	10	10
2)	1	9	10	10
3)	10	10	9	10
4)	9	10	1	9
5)	1	9	9	10

(2008)

13) පහත පෙන්වා ඇති පරිපථවල (A) සහ (V) මගින් නිරූපණය වන්නේ පිළිවෙළින් ඇමීටරයක් සහ වෝල්ට්මීටරයකි. හානි වීමේ වැඩි ම අවදානමක් ඇත්තේ කුමන සැකැස්මේ ඇති ඇමීටරයට ද?



(1) (2) (3) (4) (5) (2009)

14) වෝල්ට්මීටරයක් සහ ඇමීටරයක් පිළිබඳව කර ඇති පහත සඳහන් ප්‍රකාශ සලකා බලන්න.

(1) වෝල්ට්මීටරයකට විශාල අභ්‍යන්තර ප්‍රතිරෝධයක් ඇති අතර ඇමීටරයකට කුඩා අභ්‍යන්තර ප්‍රතිරෝධයක් ඇත.
(2) පරිපථ කොටසක් හරහා වෝල්ටීයතාව මැනීම සඳහා වෝල්ට්මීටරයක් එම කොටසට ශ්‍රේණිගතව සම්බන්ධ කරනු ලැබේ.
(3) ඇමීටරයකින් මනින්නේ එය හරහා ඒකක කාලයකදී ගලන ආරෝපණ ප්‍රමාණයයි.

ඉහත ප්‍රකාශ අතරින්,

(1) (A) පමණක් සත්‍ය වේ. (2) (C) පමණක් සත්‍ය වේ.
(3) (A) සහ (B) පමණක් සත්‍ය වේ. (4) (A) හා (C) පමණක් සත්‍ය වේ.
(5) (B) සහ (C) පමණක් සත්‍ය වේ. (2010)

15) රූපයේ පෙන්වා ඇති පරිපථය සාදා ඇත්තේ පරිපූර්ණ සංරචක භාවිතයෙනි. A ඇමීටරයක් වන අතර V_X වෝල්ට් මීටරයකි. ශිෂ්‍යයෙකු වැරදීමකින් A ඇමීටරය V_Y නම් පරිපූර්ණ වෝල්ට්මීටරයක් මගින් ප්‍රතිස්ථාපනය කළහොත් V_X සහ V_Y හි කියවීම පිළිවෙළින් වන්නේ,



(1) 1V, 1V (2) 1V, 0 (3) 2V, 0 (4) 0, 1V (5) 2V, 2V (2010)

Scanned by CamScanner

16) පෙන්වා ඇති පරිපථයෙහි V වෝල්ටීයතාවක් සහිත බැටරියෙහි සහ A ඇමීටරයෙහි ඇත්තේ නොගිණිය හැකි අභ්‍යන්තර ප්‍රතිරෝධයකි. එක්තරා වෝල්ට්මීටරයක් වෙන වෙනම R_1 සහ R_2 හරහා සම්බන්ධ කළ විට A ඇමීටරයේ පාඨාංකයේ අනාවරණය කළ හැකි වෙනස්වීමක් ඇති වන්නේ වෝල්ට්මීටරය R_2 හරහා සම්බන්ධ කළ විට පමණි. පහත සඳහන් ප්‍රකාශ සලකා බලන්න.



(A) $R_1 > R_2$

(B) ප්‍රශ්නයේ සඳහන් කර ඇති ඇමීටර පාඨාංකයේ 'වෙනස්වීම' සත්‍ය වශයෙන්ම 'වැඩිවීම'කි.

(C) R_1 හි අගය වෝල්ට්මීටරයේ අභ්‍යන්තර ප්‍රතිරෝධයට වඩා ඉතා අඩුය.

ඉහත ප්‍රකාශ අතුරින්

1) (A) පමණක් සත්‍ය වේ.
2) (B) පමණක් සත්‍ය වේ.
3) (C) පමණක් සත්‍ය වේ.
4) (B) සහ (C) පමණක් සත්‍ය වේ.
5) (A), (B) සහ (C) සියල්ලම සත්‍ය වේ.

(2011 O)

17) 0 – 20 V වෝල්ට් මීටරයක් 0 – 20 mA ඇමීටරයක් බවට පත් කර ගැනීමට ශිෂ්‍යයෙකුට අවශ්‍ය ඇත. ඔහු වෝල්ට් මීටරයේ අභ්‍යන්තර ප්‍රතිරෝධය අනන්ත යැයි උපකල්පනය කර සම්බන්ධ කළ යුතු ප්‍රතිරෝධකයේ අගය ගණනය කළේ ය. වෝල්ට්මීටරයට සත්‍ය වශයෙන්ම 10 kΩ අභ්‍යන්තර ප්‍රතිරෝධයක් ඇත්නම්, විකරණය කරන ලද ඇමීටරය 20 mA දක්වන විට, සත්‍ය ධාරාව කුමක් වනු ඇත් ද?

1) 1.81 mA
2) 2 mA
3) 20 mA
4) 22 mA
5) 23 mA

(2012 O-54)

18) දී ඇති පරිපථයෙහි, V වෝල්ට්මීටරය සහ A ඇමීටරය වැරදීමකින් එකිනෙකට මාරු වී ඇතොත්, ඇමීටරයෙහි සහ වෝල්ට්මීටරයෙහි කියවීම පිළිවෙළින් විය හැක්කේ, (A සහ V පරිපූර්ණ උපකරණ බව සලකන්න.)



1) 0 A, 0 V
2) 0 A, 5 V
3) 0 A, 2.5 V
4) 0.1 A, 0 V
5) 0.05 A, 2.5 V

(2015-20)

06 විභව මානය

1) දිග L සහ ප්‍රතිරෝධය R වූ ඒකාකාර කම්බියක් අභ්‍යන්තර ප්‍රතිරෝධය r සහ විද්‍යුත් ගාමක බලය E වූ බැටරියක් හරහා සම්බන්ධ කොට ඇත. ඉතා විශාල අභ්‍යන්තර ප්‍රතිරෝධයක් ඇති වෝල්ට්මීටරයක් කම්බියේ එක් කෙළවරකට සහ එම කෙළවරේ සිට x දුරකින් පිහිටි ලක්ෂ්‍යයකට රූපයේ දැක්වෙන ආකාරයට සම්බන්ධ කොට ඇත. වෝල්ට්මීටරයේ පාඨාංකය V සහ x දුර අතර සම්බන්ධතාව වනුයේ,



1) $V = \frac{E}{R}x$
2) $V = \frac{E}{L}x$
3) $V = \frac{E}{(R+r)}x$
4) $V = \frac{E}{(R+r)}\frac{x}{L}$
5) $V = \frac{E}{(R+r)}\frac{R}{L}x$

(1987)

2) දෙන ලද විභවමාන පරිපථයෙහි කම්බියේ සංතුලන දිග l, R ප්‍රතිරෝධයෙන් ස්වායත්ත බව නිරීක්ෂණය කරන ලදී. මීට හේතුව ලෙස පහදා දීම විය හැක්කේ,



1) P කෝෂයේ අභ්‍යන්තර ප්‍රතිරෝධය ඉතා විශාල වීමය.
2) P කෝෂයේ අභ්‍යන්තර ප්‍රතිරෝධය ශුන්‍ය වීම.
3) Q කෝෂයේ අභ්‍යන්තර ප්‍රතිරෝධය ඉතා විශාල වීමය.
4) Q කෝෂයේ අභ්‍යන්තර ප්‍රතිරෝධය ශුන්‍ය වීම.
5) විභවමාන කම්බියේ ප්‍රතිරෝධය ඉතා විශාල වීමය.

(1988)

Scanned by CamScanner

3) පෙන්වා ඇති විභවමාන පරිපථයේ A කෝෂයට E_1 විද්‍යුත් ගාමක බලයක් ඇති අතර එහි අභ්‍යන්තර ප්‍රතිරෝධය නොසලකා හැරිය හැකි තරම් කුඩාය. B කෝෂයෙහි විද්‍යුත් ගාමක බලය E_2 වන අතර එයට පරිමිත අභ්‍යන්තර ප්‍රතිරෝධයක් ඇත. $E_2 > E_1$ නම් සමතුලිත ලක්ෂ්‍යයක්



1) ලබාගත හැක්කේ A සමඟ ශ්‍රේණිගත ප්‍රතිරෝධයක් සම්බන්ධ කිරීමෙනි.
2) ලබාගත හැක්කේ B සමඟ ශ්‍රේණිගත ප්‍රතිරෝධයක් සම්බන්ධ කිරීමෙනි.
3) ලබාගත හැක්කේ A සමඟ සමාන්තරගත ප්‍රතිරෝධයක් සම්බන්ධ කිරීමෙනි.
4) ලබාගත හැක්කේ B සමඟ සමාන්තරගත ප්‍රතිරෝධයක් සම්බන්ධ කිරීමෙනි.
5) ඉහත සඳහන් ආකාරයට ප්‍රතිරෝධයක් සම්බන්ධ කිරීමෙන් ලබා ගත නොහැක. (1989)

පහත දක්වා ඇති විස්තරය ප්‍රශ්න අංක 4 සහ 5 ට පිළිතුරු සැපයීම සඳහා උපයෝගී කර ගන්න.

PX සහ XQ ඒකාකාර සෘජු කම්බි දෙකක් පෙන්වා ඇති ආකාරයට ශ්‍රේණි ගතව සම්බන්ධ කර ඇත. PX තුනී කම්බියක් වන අතර එහි ප්‍රතිරෝධය 4Ω වේ. XQ ඝනකම කම්බියක් වන අතර එහි ප්‍රතිරෝධය 2Ω වේ. කම්බි දෙකම එක සමාන දිගකින් යුක්ත වේ.



4) P X Q ඔස්සේ එක් එක් ලක්ෂ්‍යයේ විභවය (V) වෙනස් වන ආකාරය සිරස් අක්ෂයේ දැක්වුව හොත්, එය පහත දක්වා ඇති කුමන ප්‍රස්තාරය මගින් නිවැරදිව දැක්වෙයිද?



(1989)

5) P X Q ඔස්සේ ඒකීය කම්බි දිගක ක්ෂමතා හානිය (W) සිරස් අක්ෂයේ දැක්වුවහොත්, එය පහත දක්වා ඇති කුමන ප්‍රස්තාරය මගින් නිවැරදිව දැක්වෙයිද?



(1989)

6) පෙන්වා ඇති විභවමාන පරිපථයේ විද්‍යුත් ගාමක බලය E_0 නියතව පවතී නම් සහ විද්‍යුත් ගාමක බලය E කාලය සමඟ අඩු වේ නම්, කාලය t සමඟ සංතුලන දිග l හි වෙනස්වීම ආසන්න වශයෙන් නිරූපණය කරන ප්‍රස්තාරය වනුයේ,





(1990)

Scanned by CamScanner

7) කෝෂය විද්‍යුත් ගාමක බලය E_1 නිර්ණය කිරීම සඳහා විභව මාන ක්‍රමයේ සැකැස්මක් රූපයේ පෙන්වා ඇත. සංතුලන දිග වැඩි කිරීම සඳහා



1) R අඩුකොට E වැඩිකළ යුතුය.
2) R අඩුකොට E නොවෙනස්ව තැබිය යුතුය.
3) E වැඩිකොට R නොවෙනස්ව තැබිය යුතුය.
4) R වැඩිකොට E නොවෙනස්ව තැබිය යුතුය.
5) විභව මාන කම්බියේ විෂ්කම්භය අඩු කළ යුතුය. (1991)

8) පරිපථයේ පෙන්වා ඇති සියලු ම කෝෂවල අභ්‍යන්තර ප්‍රතිරෝධය නොගිණිය හැකිය. වෝල්ට්මීටරයේ පාඨාංකය වනුයේ,



1) 0V කි. 2) 2V කි.
3) 4V කි. 4) 6V කි.
5) 10V කි. (1992)

9) රූපයේ පෙන්වා ඇති විභවමාන සැකැස්මෙහි AB කම්බියෙහි දිග 200 cm වන අතර E_1 හි ඇති සම්මත කෝෂයෙහි විද්‍යුත් ගාමක බලය 1.0183V වේ. AP දිග 101.83 cm වන සේ P ස්පර්ශකය සකසා ඇති අතර, G ගැල්වනෝමීටරයේ උත්ක්‍රමයක් නැති වන තෙක් R ප්‍රතිරෝධය වෙනස් කරනු ලැබේ. එවිට A සහ B ලක්ෂ්‍ය අතර සම්පූර්ණ විභව බැස්ම



1) 0.01V 2) 0.1V 3) 0.2V 4) 1V 5) 2V (1993)

10) පෙන්වා ඇති පරිපථයේ එක් එක් කෝෂයේ අභ්‍යන්තර ප්‍රතිරෝධය නොගිණිය හැකි තරම් කුඩාය. V වෝල්ට්මීටරයේ පාඨාංකය වනුයේ,



1) 0 2) 3V 3) 6V
4) 9V 5) 12V (1994)

11) එකිනෙකට වෙනස් හරස්කඩ ක්ෂේත්‍ර ඵලයන්ගෙන් සහ ප්‍රතිරෝධකතාවයන් ගෙන් යුක්ත වූවද එහෙත් L_0 නම් එකම දිගකින් යුක්ත වූද PQ සහ RS නම් ඒකාකාර කම්බි දෙකක් රූපයේ පෙන්වා ඇති පරිදි V විභවයකට යටත් කර ඇත. A සහ B යනු මෙම කම්බි මත ඇති ලක්ෂ්‍ය දෙකක් වන අතර $PA = l_1$ සහ $RB = l_2$ නම් A සහ B ලක්ෂ්‍ය අතර විභව අන්තරය රඳා පවතිනු ලබන්නේ



1) සියලුම පරාමිති, එනම් හරස්කඩ ක්ෂේත්‍ර ඵල, ප්‍රතිරෝධකතා, L_0, V සහ $(l_2 - l_1)$ මත වේ.
2) ප්‍රතිරෝධකතා, L_0, V සහ $(l_2 - l_1)$ මත පමණි.
3) L_0, V සහ $(l_2 - l_1)$ මත පමණි.
4) V සහ $(l_2 - l_1)$ මත පමණි.
5) $(l_2 - l_1)$ මත පමණි. (1995)

12)



රූපයේ පෙන්වා ඇති විභවමාන පරිපථයේ R වෙනස් කළ විට විභවමානයේ සංතුලන දිග l එක ම අගයේ පවතින බව නිරීක්ෂණය කරන ලදි. මෙය සිදු විය හැක්කේ,

A) Y හි අභ්‍යන්තර ප්‍රතිරෝධය, R සමඟ සසඳන විට නොගිණිය හැකි නම් පමණි.
B) X හි අභ්‍යන්තර ප්‍රතිරෝධය, R සමඟ සසඳන විට නොගිණිය හැකි නම් පමණි.
C) විභවමාන කම්බියේ ප්‍රතිරෝධය, R සමඟ සසඳන විට ඉතා ඉහළ නම් පමණි.

ඉහත ප්‍රකාශවලින්
1) A පමණක් සත්‍ය වේ. 2) B පමණක් සත්‍ය වේ.
3) C පමණක් සත්‍ය වේ. 4) A සහ B පමණක් සත්‍ය වේ.
5) A සහ C පමණක් සත්‍ය වේ. (1996)

Scanned by CamScanner

13) රූපයේ පෙන්වා ඇති විභවමාන පරිපථයේ P කෝෂයේ විද්‍යුත් ගාමක බලය E_P ද අභ්‍යන්තර ප්‍රතිරෝධ r_P ද වන අතර Q කෝෂයේ විද්‍යුත් ගාමක බලය E_Q ද අභ්‍යන්තර ප්‍රතිරෝධ r_Q ද වේ. මෙම සැකැස්මේ දී සංතුලන ලක්ෂ්‍යයක් ලබා ගැනීමට නොහැකි වීම සඳහා, දී ඇති පහත සඳහන් හේතු සලකා බලන්න.



A) $E_P > E_Q$ සහ $r_P = 0,\ r_Q > 0$
B) $E_P < E_Q$ සහ $r_P > 0,\ r_Q = 0$
C) $E_P = E_Q$ සහ $r_P > 0,\ r_Q > 0$

ඉහත හේතු අතරින් සත්‍ය වන්නේ,

1) A පමණි. 2) B පමණි. 3) C පමණි.
4) B සහ C පමණි. 5) A, B සහ C සියල්ලම. (1997)

14) 

රූපයේ පෙන්වා ඇති විභවමාන පරිපථයේ P කෝෂයේ අග්‍ර හරහා R ප්‍රතිරෝධයක් ඇති ප්‍රතිරෝධකයක් සම්බන්ධ කළ විට l සංතුලන දිග $\frac{l}{2}$ දක්වා අඩු වේ. P කෝෂයේ අභ්‍යන්තර ප්‍රතිරෝධය වනුයේ,

1) $\frac{R}{2}$ 2) R 3) 2R 4) $\frac{3R}{2}$ 5) 3R (1998)

15) කෝෂයක E විද්‍යුත් ගාමක බලය නිර්ණය කිරීම සඳහා භාවිතා කළ හැකි විභවමාන පරිපථ සටහනක් රූපයේ පෙන්වා ඇත. E_s යනු සම්මත කෝෂයෙහි විද්‍යුත් ගාමක බලයයි.
පරිපථයේ නියමිත ක්‍රියාකාරීත්වයට අදාළ ව පහත දී ඇති වගන්ති අතුරින් කුමක් සාවද්‍ය වේද?



1) E_S , E ට වඩා විශාල විය යුතුය.
2) සම්මත කෝෂයේ අභ්‍යන්තර ප්‍රතිරෝධය වැදගත් නැත.
3) උදාසීන ලක්ෂ්‍ය A කෝෂයේ අභ්‍යන්තර ප්‍රතිරෝධය මත රඳා පවතී.
4) සියලු ම කෝෂවල අග්‍ර රූපයේ පෙන්වා ඇති පරිදි නිවැරදි ව සම්බන්ධ කොට ඇත.
5) A කෝෂය මගින් සර්පණ කම්බියට නොසැලෙන ධාරාවක් සැපයිය යුතුය. (1999)

16) පෙන්වා ඇති විභවමාන පරිපථයේ E කෝෂයෙහි අභ්‍යන්තර ප්‍රතිරෝධය නොසලකා හැරිය හැකි තරම කුඩාය. R ප්‍රතිරෝධයක් E ට ශ්‍රේණිගතව සම්බන්ධ කළ විට E_0 කෝෂය සමඟ ලැබෙන l සංතුලන දිග දෙගුණ වේ. විභවමාන කම්බියේ ප්‍රතිරෝධය



1) $\frac{R}{2}$ 2) R 3) 2R 4) 3R 5) 4R (2000)

17) ප්‍රතිරෝධයක් (AB), පරිපූර්ණ වෝල්ට්මීටරයක්, පරිපූර්ණ ඇමීටරයක් සහ වෝල්ටීය සැපයුමක් රූප සටහනේ පෙනෙන අයුරු සම්බන්ධ කර ඇත. P ස්පර්ශක යතුර A සිට B දක්වා AB දිගේ සර්පණය කරමින් වෝල්ට්මීටරයේ පාඨාංකය (V) සහ ඇමීටරයේ පාඨාංකය (I) ලබා ගන්නා ලදී. පහත දී ඇති කුමන ප්‍රස්තාර යුගලය මගින් x සමඟ I හා V හි විචලනය වඩාත්ම හොඳින් නිරූපණය කරන්නේ ද?





1)



2)

Scanned by CamScanner



(2001)

18) පෙන්වා ඇති පරිපථයේ ඇති විද්‍යුත් ගාමක බලය E_1 සහ E_2 $(E_1 > E_2)$ වන කෝෂ දෙකෙහි නොගිණිය හැකි අභ්‍යන්තර ප්‍රතිරෝධ ඇත. A ඇමීටරයේ පාඨාංකය ශුන්‍ය වනුයේ R හි කුමන අගයකටද?



1) $\frac{E_1}{E_2}R_2$ 2) $\left(\frac{E_1+E_2}{E_1}\right)R_1$ 3) $\left(\frac{E_1-E_2}{E_1}\right)R_1$

4) $\left(\frac{E_1+E_2}{E_2}\right)R_1$ 5) $\left(\frac{E_1-E_2}{E_2}\right)R_1$

(2001)

19) විද්‍යුත් ගාමක බලය 1.3V වන E කෝෂය සඳහා පෙන්ව ඇති විභවමාන පරිපථයේ අනුරූප සංතුලන දිග 65 cm බව සොයා ගන්නා ලදී. විද්‍යුත් ගාමක බලය නොදන්නා වෙනත් කෝෂයක් E සඳහා ආදේශ කළ විට එම සංතුලන දිග 45 cm බව සොයා ගන්නා ලදී. මෙම දෙවන කෝෂයේ විද්‍යුත් ගාමක බලය වන්නේ



1) 1.5V 2) 1.1V 3) 1.0V 4) 0.9V 5) 0.8V (2002)

20) පෙන්වා ඇති පරිපථයේ අඩංගු කෝෂයට නොගිණිය හැකි අභ්‍යන්තර ප්‍රතිරෝධයක් ඇත. P දර්ශකය A සිට B දක්වා ගෙන යනු ලබන විට පහත සඳහන් කුමක් මගින් X හි විභවයේ (V_X) විචලනය වඩාත් ම හොඳින් නිරූපණය කරයිද?





(2002)

21) පරිපථයේ පෙන්වා ඇති බැටරිය නොගිණිය හැකි අභ්‍යන්තර ප්‍රතිරෝධයක් ඇත. ස්විච්චිය විවෘත කර ඇතිවිට පරිපථය ඔස්සේ විභවයේ වෙනස්වීම ඉතා හොඳින් නිරූපණය වනුයේ,





(2003)

Scanned by CamScanner

22) පෙන්වා ඇති විභවමාන පරිපථයේ, සලකුණු කොට ඇති සංතුලන දිග l ලැබෙනුයේ අභ්‍යන්තර ප්‍රතිරෝධයක් සහිත P නම් කෝෂයක් සඳහාය. තවත් ප්‍රතිරෝධයක් P සමඟ සම්බන්ධ කළ විට



1) ප්‍රතිරෝධකය P සමඟ සමාන්තරගත නම් l හි අගය වැඩි වේ.
2) ප්‍රතිරෝධකය P සමඟ සමාන්තරගත නම් l හි අගය වෙනස් නොවේ.
3) ප්‍රතිරෝධකය P සමඟ ශ්‍රේණිගත නම් l හි අගය වැඩි වේ.
4) ප්‍රතිරෝධකය P සමඟ ශ්‍රේණිගත නම් l හි අගය අඩු වේ.
5) ප්‍රතිරෝධකය P සමඟ ශ්‍රේණිගත නම් l හි අගය වෙනස් නොවේ. (2004)

23) පෙන්වා ඇති පරිපථවල B යනු බැටරියක් ද, P සර්පණ ස්පර්ශකයක් සහිත R විචල්‍ය ප්‍රතිරෝධකයක් සහ S යනු අචල ප්‍රතිරෝධකයක් ද වේ. ඕම් නියමය සත්‍යාපනය කිරීම සඳහා පහත දැක්වෙන පරිපථවලින් වඩාත්ම සුදුසු වන්නේ කුමක් ද?



(2005)

24)



විභවමාන පරිපථයක් රූපයේ දැක්වෙන ආකාරයට සකසා ඇත. ගැල්වනෝමීටරය පිළිවෙලින් A ලක්ෂ්‍යයට සහ B ලක්ෂ්‍යයට සම්බන්ධ කළ විට ලබාගත් සංතුලන දිග වනුයේ 75 cm සහ 300 cm ය. $\frac{R_2}{R_1}$ අනුපාතය වනුයේ

1) 4   2) $\frac{1}{2}$ 3) $\frac{1}{3}$ 4) $\frac{1}{4}$ 5) 3   (2005)

25) රූපයේ දක්වා ඇති විභවමාන පරිපථයෙහි S යතුර A හා සම්බන්ධ කළ විට සංතුලන දිග l වේ. S යතුර B හා සම්බන්ධ කළ විට සංතුලන දිග වනුයේ



1) $\frac{l}{4}$ 2) $\frac{l}{2}$ 3) $\frac{3l}{4}$ 4) $\frac{4l}{3}$ 5) $\frac{5l}{4}$

(2006)

26) A සහ B හරහා විද්‍යුත්ගාමක බලය 2V වූ කෝෂයක් රූපයේ දැක්වෙන පරිදි සම්බන්ධ කිරීමෙන් විභවමානයක් සංතුලනය කරනු ලැබේ. සුදුසු වි.ගා.බ. අගයක් ඇති E නම් වෙනත් කෝෂයක් 2V කෝෂය සමඟ ශ්‍රේණිගතව සම්බන්ධ කර එම සංතුලන දිගම ලබාගත හැකි ආකාරය වන්නේ





(2007)

Scanned by CamScanner

27) 

රූපයේ පෙන්වා ඇති පරිපථයෙහි A මැද -බින්දු ඇමීටරයට, දිගා දෙකෙන් ඕනෑම දිගාවකට ධාරා දැක්වීමට හැකියාවක් ඇත්තේ V_0'

1) 1 V වුවහොත් ය. 2) 2 V වුවහොත් ය.
3) 4 V වුවහොත් ය. 4) 5 V වුවහොත් ය.
5) 6 V වුවහොත් ය. (2009)

28) විභවමානයක සංවේදීතාව වැඩි කළ හැක්කේ,
(1) කම්බිය හරහා සම්බන්ධ කර ඇති කෝෂයේ වි. ගා. බ වැඩි කිරීමෙනි.
(2) කම්බියේ ප්‍රතිරෝධතාව අඩු කිරීම මගිනි.
(3) කම්බිය සමග ශ්‍රේණිගතව ප්‍රතිරෝධයක් සමබන්ධ කිරීම මගිනි.
(4) කම්බියේ විෂ්කම්භය අඩු කිරීම මගිනි.
(5) කම්බියේ උෂ්ණත්වය කාමර උෂ්ණත්වයේ පවත්වා ගැනීම මගිනි. (2010)

29) පෙන්වා ඇති පරිපථයේ V_0 මගින් දක්වා ඇත්තේ නොගිණිය හැකි අභ්‍යන්තර ප්‍රතිරෝධයක් සහිත බැටරියක වෝල්ටීයතාව වන අතර E මගින් නිරූපණය වන්නේ පරිමිත අභ්‍යන්තර ප්‍රතිරෝධයක් සහිත කෝෂයකි. R සමග සංතුලන දිග l හි වෙනස්වීම වඩාත් හොඳින් නිරූපණය කරන්නේ,





(2011 N)

30) (X) නම් කෝෂයක වි.ගා.බ. මැනීම සඳහා විභවමානයක් භාවිත කරමින් සිටින විට දී එහි කම්බියෙහි දෙකෙළවරට සම්බන්ධ කර ඇති 2V ඇකියුම්ලේටරයෙහි වෝල්ටීයතාව අඩු වෙමින් පවතින බව සොයා ගන්නා ලදී. ඇකියුම්ලේටරයේ වෝල්ටීයතාවයෙහි අඩු වීමක් සිදු වුව ද විභවමාන කම්බියේ නියත සංතුලන ලක්ෂ්‍යයක් ලබා ගත හැකි බව ශිෂ්‍යයකු විසින් නිරීක්ෂණය කරන ලදී. මෙම නිරීක්ෂණය සඳහා ශිෂ්‍යයා විසින් දෙන ලද පහත සඳහන් පැහැදිලි කිරීම් වලින් කුමක් පිළිගත හැකිද?

1) සංතුලන දිග ඇකියුම්ලේටරයේ වෝල්ටීයතාව මත රඳා නොපවති.
2) විභවමාන කම්බියේ දෙකෙළවර හා සම්බන්ධ දෝෂයන්ගේ වෙනස්කම්, නියත සංතුලන ලක්ෂ්‍යක් ලැබීමට හේතුව විය හැකිය.
3) ඇකියුම්ලේටරයේ වෝලටීයතාව අඩු වෙමින් පැවතිය ද (X) කෝෂය මගින් කම්බිය හරහා නියත විභව අනුක්‍රමණයක් පවත්වා ගෙන ඇත.
4) ඇකියුම්ලේටරයේ වෝල්ටීයතාව අඩු වීමේ බලපෑම, කම්බියේ උෂ්ණත්වය වැඩි වීම මගින් ශුන්‍ය කර ඇත.
5) පරීක්ෂණය කර ගෙන යන අතරතුර දී (X) කෝෂයේ වෝල්ටීයතාව ද පහත වැටෙමින් පැවතෙන්නට ඇත. (2015-19)

Scanned by CamScanner

පිළිතුරු

1) ඕම් නියමය හා ප්‍රතිරෝධ පද්ධති

(01) 2 (02) 3 (03) 2 (04) 1 (05) 1 (06) 5 (07) 2 (08) 3 (09) 3 (10) 3
(11) 5 (12) 1 (13) 4 (14) 2 (15) 3 (16) 3 (17) 1 (18) 3 (19) 4 (20) 4
(21) 5 (22) 3 (23) 3 (24) 5 (25) 4 (26) 4 (27) 5 (28) 2 (29) 1 (30) 5
(31) 2 (32) 1 (33) 1 (34) 4 (35) 2 (36) 2 (37) 4 (38) 2 (39) 4 (40) 2
(41) 4 (42) 3 (43) 2 (44) 1 (45) 3 (46) 4 (47) 5 (48) 3 (49) 5 (50) 5
(51) 5 (52) 4 (53) 3 (54) 2 (55) 5 (56) 5 (57) 4 (58) 1 (59) 1 (60) 1
(61) 4 (62) 3 (63) all (64) 3 (65) 1 (66) 3 (67) 2 (68) 2 (69) 3 (70) 5
(71) 2 (72) 5 (73) 3 (74) 4 (75) 2 (76) 2 (77) 5 (78) 3 (79) 3 (80) 4
(81) 4 (82) 4

2) විද්‍යුත් ක්ෂමතාව හා තාපන ඵලය

(01) 4 (02) 2 (03) 2 (04) 3 (05) 5 (06) 3 (07) 4 (08) 4 (09) 3 (10) 4
(11) 2 (12) 5 (13) 5 (14) 4 (15) 4 (16) 4 (17) 3 (18) 3 (19) 4 (20) 5
(21) 5 (22) 4 (23) 3 (24) 5 (25) 2 (26) 5 (27) 2 (28) 2 (29) 5 (30) 4
(31) 2 (32) 3 (33) 4 (34) 2 (35) 3 (36) 3,5 (37) 4 (38) 5 (39) 4 (40) 5
(41) 2 (42) 5 (43) 4 (44) 5 (45) 2 (46) 2 (47) 1 (48) 4 (49) 4 (50) 4
(51) 5

3) කර්චොෆ් නියම හා කෝෂ පද්ධති

(01) 2 (02) 5 (03) 3 (04) 1 (05) 4 (06) 4,2 (07) 4 (08) 2 (09) 3 (10) 5
(11) 4 (12) 1 (13) 3 (14) 3 (15) 3 (16) 3 (17) 2 (18) 5 (19) 1 (20) 3
(21) 3 (22) 3 (23) 2 (24) 2 (25) 4 (26) 2 (27) 4 (28) 5 (29) 1 (30) 4
(31) 3 (32) 4 (33) 5 (34) 5 (35) 4 (36) 2 (37) 3 (38) 1 (39) 3 (40) 2
(41) 4 (42) 4 (43) 1 (44) 3 (45) 3 (46) 2 (47) 4 (48) 4 49) 2

4) වීට්ස්ටන් සේතු හා මීටර් සේතු

(01) 2 (02) 4 (03) 3 (04) 3 (05) 5 (06) 3 (07) 5 (08) 4 (09) 1 (10) 5
(11) 4 (12) 1 (13) 3 (14) 1

5) සළ දඟර මීටර

(01) 3 (02) 2,4 (03) 3 (04) 3 (05) 4 (06) 3 (07) 4 (08) 5 (09) 4 (10) 4
(11) 5 (12) 2 (13) 4 (14) 4 (15) 5 (16) 4 (17) 4 (18) 2

6) විභව මානය

(01) 5 (02) 4 (03) 4 (04) 1 (05) 2 (06) 3 (07) 4 (08) 3 (09) 5 (10) 3
(11) 3 (12) 1 (13) 4 (14) 2 (15) 1 (16) 2 (17) 1 (18) 5 (19) 4 (20) 4
(21) 3 (22) 5 (23) 3 (24) 5 (25) 5 (26) 2 (27) 5 (28) 3 (29) 1 (30) 5

Scanned by CamScanner